# HUMAN RESOURCE MANAGEMENT (Part-IV)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# ආකර්ෂණ ක්‍රියාවලිය

සංවිධානයක අරමුණු හා පරමාර්ථ ඉටු කිරීම පිණිස සංවිධානයකට උපකාරී වන්නා වූ හැකියා හා ධනාත්මක ආකල්පවලින් යුත් රැකියා අපේක්ෂකයන් ආයතනය වෙත අද්දා ගැනීමේ ක්‍රියාවලිය ආකර්ෂණය යි.

ආකර්ෂණ ක්‍රියාවලියේ ප්‍රතිඵලය වනුයේ නව සේවාදායකයන් වශයෙන් රැකියා සඳහා තෝරා ගත හැකි හෝ නොහැකි හෝ රැකියා සොයන්නන් සමූහයක් ජනිත වීම යි. ආකර්ෂණ ක්‍රියාවලියට අයත් පියවර පහත සටහන මඟින් දැක්විය හැකි ය.

ClassWork.LK

# ආකර්ෂණ ක්‍රියාවලියට අයත් පියවර

**1. රැකියා ඇබෑර්තු හඳුනා ගැනීම**

(මිනිස් බල සැලැස්ම, කළමනාකරුවන්ගේ විශේෂ ඉල්ලීම්)

⬇

**2. රැකියා නියමයන් අධ්‍යයනය කිරීම**

(රැකියා විශ්ලේෂණ තොරතුරු, කළමනාකරුවන්ගේ මත)

⬇

**3. ආකර්ෂණයට අදාළ සාධක සලකා බැලීම**

(සංවිධාන ප්‍රතිපත්ති, පිරිවැය, කාලය හා වෙනත්)

⬇

**4. අයදුම්පත පිළියෙළ කිරීම**

⬇

**5. ආකර්ෂණ ක්‍රමය / ක්‍රම තෝරා ගැනීම (අභ්‍යන්තර/බාහිර)**

⬇

**6. ක්‍රියාත්මක කිරීම**

(පුද්ගලයන් ඇබෑර්තු සඳහා ඉල්ලුම් කිරීම

⬇

**7. අයදුම්පත් ඇගයීම**

හෙනරත් එච්. ඩී. එම්. පී. ඕපාත., සේවා මණ්ඩල කළමනාකරණය (1995)

ClassWork.LK

❖ ආකර්ෂණයට බලපාන වැදගත් ම සාධකය වනුයේ බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය යි. ඊට අමතරව පිරිවැය, කාලය, ශ්‍රම වෙළෙඳ පොළේ තත්ත්වය ආදිය ද සලකා බලයි.

## ආකර්ෂණ ක්‍රියාමාර්ග වර්ගීකරණය

1. අභ්‍යන්තර ආකර්ෂණ මාර්ග
2. බාහිර ආකර්ෂණ මාර්ග

## 1. අභ්‍යන්තර ආකර්ෂණ මාර්ග

අභ්‍යන්තර ආකර්ෂණ මාර්ග යනු ආයතනයේ ඇතුළතින් සේවකයන් ආකර්ෂණය කර ගැනීමයි.

ClassWork.LK

## අභ්‍යන්තර ආකර්ෂණ ක්‍රම

- **රැකියා දැන්වීම් පළ කිරීම (Job Posting)**

ආයතනය තුළ ඇති දැන්වීම් පුවරුවල, ආයතනික පුවත්පත්, සඟරාවල දැන්වීම් පළ කර ඇබෑර්තු පිළිබඳ දැනුම් දීම යි.

- **කුසලතා ඉන්වෙන්ට්‍රි / කුසලතා ලේඛන (Skill Inventories / Skill List)**

අදාළ රැකියා ඇබෑර්තු සඳහා අයදුම් කිරීමට හැකියාව ඇති අභ්‍යන්තර සේවකයන් හඳුනා ගැනීම සඳහා මිනිස් බල සැලසුම්කරණයේ දී පිළියෙළ කළ සේවකයන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප ඇතුළත් කුසලතා ලේඛන භාවිත කිරීම.

ClassWork.LK

- **අභ්‍යන්තර ජාලය (Intranet)**

අභ්‍යන්තර ජාලයේ රැකියා ඇබෑර්තු පිළිබඳ දැන්වීම් පළ කර අයදුම්පත් කැඳවීම.

- **අභ්‍යන්තර සේවකයන් හඳුන්වා දීම (Employee Referrals)**

වර්තමාන සේවාදායකයන් තම හිතවතුන්, ඥාතීන් වැනි දන්නා පුද්ගලයන් ඇබෑර්තු සඳහා නිර්දේශ කිරීම යි.

- **අනුප්‍රාප්තික සැලැස්ම (Succession Plan)**

ආයතනයක සිටින සේවකයන්ගේ කාර්ය සාධනය, සුදුසුකම්, පළපුරුද්ද, ජ්‍යෙෂ්ඨත්වය ආදි කරුණු මත විධිමත් ලේඛන පවත්වා ගෙන යයි. ඇබෑර්තුවක් ඇති වූ විට ඒ සඳහා ඊළඟට වඩාත් සුදුසු පුද්ගලයන් යොදා ගනී.

ClassWork.LK

# අභ්‍යන්තර සේවක ආකර්ෂණයේ වාසි

- සේවකයන් අභිප්‍රේරණය වීම.
- මනා ශ්‍රමික සම්බන්ධතා ඇති වීම.
- යෝග්‍යතම සේවකයන් රඳවා ගැනීමේ පහසුව.
- ආකර්ෂණය හා බඳවා ගැනීම සඳහා වන පිරිවැය අඩු වීම.
- සේවකයන්ගේ ආයතනයට ඇති ළැදියාව හා කැප වීම වැඩි වීම.
- සේවක අනුස්ථාපනය සඳහා යන කාලය අඩු වීම.

ClassWork.LK

## අභ්‍යන්තර ආකර්ෂණයේ අවාසි

- නව දැනුම කුසලතා හා ආකල්ප සංවිධානයට ගලා නොඒම.
- යෝග්‍යතම පුද්ගලයන් බඳවා ගැනීමේ අවකාශය අඩු වීම.
- සේවකයන් අතර අනවශ්‍ය තරගයක් ඇති වීම.
- පුහුණුව සඳහා ඉහළ පිරිවැයක් දැරීමට සිදු වීම.
- ව්‍යාපාර සංවිධානය යල්පැනීමට ඇති ඉඩකඩ වැඩි වීම.

ClassWork.LK

# බාහිර ආකර්ෂණය

සංවිධානයක තනතුරු සඳහා සංවිධානයකට පරිබාහිර ව අයදුම්කරුවන් ආකර්ෂණය කර ගැනීම බාහිර ආකර්ෂණයයි.

# බාහිර ආකර්ෂණ ක්‍රම

- මාධ්‍ය දැන්වීම් මගින් (මුද්‍රිත/විද්‍යුත්)
- අන්තර්ජාලය/රැකියා වෙබ් අඩවි මගින්
- අතීත සේවකයන් මගින්
- අධ්‍යාපන හා වෘත්තීය ආයතන මගින්
- රැකියා නියෝජිත ආයතන මගින්
- වෘත්තීය සංගම් මගින්
- රැකියා පොළ මගින්

ClassWork.LK

## බාහිර සේවක ආකර්ෂණය මගින් සංවිධානයක් අත්කර ගන්නා වාසි

- නව දැනුම, ඇති පුද්ගලයන් ආකර්ෂණය කර ගත හැකි වීම.
- විශාල පිරිසක් ආකර්ෂණය කර ගත හැකි වීම.
- තනතුරු සඳහා යෝග්‍යතම පුද්ගලයන් බඳවාගත හැකි වීම.
- පුහුණු ශ්‍රමය බඳවා ගැනීමෙන් පුහුණුව හා සංවර්ධනය සඳහා වැය වන පිරිවැය අඩු වීම.
- ව්‍යාපාර සංවිධානය නවීකරණය වීම හෙවත් නැවත ගොඩනැංවීමට හැකි වීම.

ClassWork.LK

# බාහිර සේවක ආකර්ෂණය තුළ ඇති විය හැකි අවාසි

- ආයතනයේ සිටින සේවකයන්ගේ අභිප්‍රේරණයට බාධා ඇති වීම.
- ආකර්ෂණය සඳහා වන පිරිවැය ඉහළ යාම.
- ආකර්ෂණය සඳහා ගතවන කාලය අධික වීම.
- සේව්‍ය-සේවක සබඳතාවලට අහිතකර ලෙස බලපෑ හැකි වීම.

Class Work LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura